**උඩුනුවර ප්‍රාදේශිය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**---------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වු මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම.**

**--------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**-------------------------**

**පහත සදහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

(අ) වැඩසටහන් පහක් යටතේ වැටුප් හා දීමනා සඳහා වියදම් දරා ඇති අතර, ඒ සඳහා ලද වැටුප් ප්‍රතිපූර්ණ මුදල් වැඩසටහන් එකක් යටතේ පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී, ලැබී තිබුණ රු.550,983 ක විවිධ තැන්පතු මුදල වෙනුවට රු.633,677 ක මුදලක් ආපසු ගෙවීම හේතුවෙන්, රු.72,694 ක් වැඩිපුර සභා අරමුදලින් වැයකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඈ) පොදු සැපයුම් ණයහිමියන්ට ගෙවියයුතු රු.1,026,210 ක මුදලක් වැරදීමකින් කර්මාන්ත ණයහිමියන්ට ගෙවීමේ වරද නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් අංක 54 න් පොදු සැපයුම් ණයහිමියන්ට හර කර, කර්මාන්ත ණයහිමියන්ට බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා, එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල හා කර්මාන්ත ණයහිමියන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.302,846 ක් වටිනා පුස්තකාල පොත් 328 ක අගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ගෙලිඔය ලංකා බැංකුවේ අංක 4070181 දරන බැංකු ගිණුමේ රු.1,000 ක ව්‍යාජ නෝට්ටු වටිනාකම නිවැරදි නොකර, දිගින් දිගටම බැංකු සැසඳුමේ දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

------------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.155,115,865 ක් වූ අතර, උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.142,784,218 ක් වූයෙන්, රු.12,331,647 ක නොසැසඳීමක් නිරීක්ෂණය වුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.

--------------------------------

(අ) ලැබියයුතු ගිණුම්.

-------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.36,223,792 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.2,631,545 ක් විය. 2014 ජූලි 11 දිනට රු.19,544,298 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්.

------------------------

2013 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.45,946,029 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.7,403,451 ක් වී තිබුණි. 2014 ජූලි 11 දිනට රු.18,670,841 ක් තවදුරටත් ගෙවියයුතුව තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

--------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.9,718,555 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය.

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,751,738 ක් වූ අතර, ඊට

ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.571,361 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.7,323,099 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.20,922,449 ක් ලැබී තිබුණු නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.25,756,180 ක් ගෙවා තිබුණි. ඒ අනුව, සභාවේ ආදායමෙන් රු.4,833,731 ක මුදලක් සේවකයින්ගේ වැටුප් ගෙවීමට වැය කර තිබුණි. එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමෙන් සියයට 11 ක් විය.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.

-------------------------------------

මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1.25:1 වු අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය වු 1.17:1 ප්‍රශස්ථ මට්ටමක නොපැවතිනි. තව ද, සමස්ත ජංගම වත්කම්වලින් සියයට 63 ක් හෙවත්, මිලියන 36 ක් කර්මාන්ත හා විවිධ ණයගැතියන් වූ අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 96 ක් හෙවත්, රුපියල් මිලියන 43 ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.

## 2.4 ආදායම් පරිපාලනය.

---------------------

### 2.4.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

--------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු.20,708,638 ක් වීය.

2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.8,333,936 ක් ලැබියයුතුව තිබුණි. එයින්, 2014 ඔක්තෝබර් 10 දිනට රු.5,740,796 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

3.1 කාර්ය සාධන ඇගයීම.

----------------------------

විගණනයට ඉදිරිපත් කළ විස්තර අනුව, ප්‍රාදේශීය සභාව විසින් වැඩසටහන් 03 ක අරමුණු ඉටු කිරීමට රු.12,415,808 ක වියදමක් දරා තිබුණු නමුත්, වෙනත් අයහාර මගින් එම අරමුණ සඳහා ලැබී තිබුණේ රු.2,403,706 ක් වුයෙන්, එම අංශවලින් ලබා ගතයුතු ආදායම් වැඩි කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.2 හඳුනාගත් අලාභ.

-------------------

වර්ෂ ගණනාවක සිට සභාවේ වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා ඇති රු.516,437 ක තොග හානී වගකිවයුතු නිලධාරීන්ගෙන් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

-------------------------------------

4.1 සංයුක්ත සැළැස්ම.

---------------------

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

**-------------------------**

**රු.43,859,829 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 විගණන හා කළමනාකරණ කමිටු.**

**------------------------------------**

**සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර, කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.**

**4.4 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.5 අයවැය පාලනය.**

**-----------------**

**(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අයවැය ලේඛනය හා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තථ්‍ය අගයයන් සමග සැසඳීමේ දි, ආදායම් විෂයයන් 06 ක සියයට 19 සිට සියයට 63 ක් හා වියදම් විෂයයන් 04 ක සියයට 22 සිට සියයට 44 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.**

**(ආ) ආදායම් ශීර්ෂ 05 කට අයත් උප විෂයයන් 07 ක් සඳහා රු.121,252,000 ක ආදායමක් ඇස්තමේන්තු කර ඇතත්, ඉන් කිසිදු ආදායමක් අය වී නොතිබුණි.**

**5.** **පද්ධති හා පාලන**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **ගිණුම්කරණය.**

**(ආ)** **අභ්‍යන්තර පාලනය**

**(ඇ)** **ආදායම් පරිපාලනය**

**(ඇ)** **ණයගැති හා ණයහිමි පාලනය.**